සම්මා සම්බුදු සරණයි !!

# 5 ,ශ්‍රේණිය ශිෂ්‍යත්ව ප්‍රශ්න පත්‍රය අන්තර්ගතය විමර්ශනය කිරීම

5-ශ්‍රේණිය
සාධනය අඩු දරුවන් ප්‍රවර්ධනය කිරීමේ වැඩමුළුව ඇසුරින්

## 1-කොටස

Jayasinghe

# ශිෂ්‍ය සාධනය ඉහළ නැංවීම
# 5 ,ශ්‍රේණිය -2023

**නවක ගුරුභවතුන් ප්‍රවර්ධනය කිරීම**
**කලාප අධ්‍යාපන කාර්යාලය - මහියංගනය**
**2023- 05 - 21**

අන්තර්ගතය :-

- ශිෂ්‍යත්ව පළමු ප්‍රශ්න පත්‍රය හඳුනාගැනීම
- අභියෝගතා සංවර්ධනය කිරීම
- ප්‍රතිකාර්යය ඉගෙනුම් සොයා බැලීම

•1-පත්‍රයෙන් ඉගෙනුම් හැකියා සහිත විභවපතා මාන 14 ක් මැනීම සිදුකරයි

1* නිරීක්ෂණ හැකියාව

2* සංජානන හැකියාව

3* ආදේශන හැකියාව

4* අන්තර් සම්බන්ධතා හැකියාව

5* අර්ථ කථන හැකියාව

6* පෙර කීමේ හැකියාව

7* තර්කන හැකියාව

08- පරිවර්තන හැකියාව

09- ගැටලු විසඳීමේ හැකියාව

10- සම්බන්ධතා දැකීමේ හැකියාව

11- හේතුවල හඳුනාගැනීමේ හැකියාව

12- තොරතුරු සංවිධානය කිරීමේ හැකියාව

13- අවකාශමය සම්බන්ධතා දැකීමේ හැකියාව


14- උපදෙස් පිළිපැදීමේ හැකියාව

# 01. නිරීක්ෂණ හැකියාව


රූප, සිතුවම්, අක්ෂර, වාක්‍යය, ප්‍රස්තාර, සංකේත, සංඛ්‍යා හා සටහන් ආදියේ සුවිශේෂ ලක්ෂණ හා අඩුපාඩු දැකීම.

- අංක 01 සහ 02 ප්‍රශ්නවල නොගැළපෙන රූපය තෝරන්න.


(01) (1)




(2)




(3)




(02) (1)



(2)




(3)





## 02. සංජානන හැකියාව

කිසියම් සිතුවමක, රූපයක හෝ තොරතුරක ඇති රටා තේරුම් ගෙන එම සිතුවම්වල රූපවල හෝ තොරතුරුවල සම්බන්ධතාව අර්ථවත් ලෙස දැනීම මෙයින් අදහස් කෙරේ.

- පහත මුල් රූප දෙස ඉහළ සිට බැලූ විට දැකිය හැකි රූපය තෝරන්න.


(01) 

(1) 


(2) 

(3) 

(02) 

(1) 

(2) 

(3) 

## 03. ආදේශන හැකියාව

| |
|---|
| කිසියම් ද්‍රව්‍යයක්, සංකේතයක්, තත්ත්වයක්, තනතුරක්, ක්‍රියාකාරකමක්, සංඛ්‍යාවක්, අක්ෂරයක්, වචනයක්, ප්‍රකාශනයක් වෙනුවට ඒ හා සමාන වෙනත් ද්‍රව්‍යයක්, සංකේතයක්, තත්ත්වයක්, තනතුරක්, ක්‍රියාකාරකමක්, සංඛ්‍යාවක්, අක්ෂරයක්, වචනයක්, ප්‍රකාශනයක් තෝරා ගැනීම ආදේශන හැකියාව වෙයි. |

(01) පළමු රූපයෙන් දක්වෙන ද්‍රව්‍ය වෙනුවට ආදේශනය කළ හැකි ද්‍රව්‍යය දක්වෙන රූපය තෝරන්න.





(1)



(2)



(3)

(02) "කතරගම" යන වචනය රහස් සංකේත යොදා ලියා තිබුණි. පහත දැක්වෙන පිළිතුරු අතරින් එය ලියා තිබුණු ආකාරය තෝරන්න.

(1) □△○△□ (2) ○△□✚△ (3) △○□□⬡

(03) හිස්තැනට වඩාත් හොඳින් ගැළපෙන වචනය තෝරා යටින් ඉරක් අඳින්න.

කළුවා .......................................... ගියා වගේ

(1) කෝට්ටේ (2) මාරපන් (3) කොළඹ

(04) පහත දැක්වෙන ප්‍රකාශයන් සඳහා ආදේශනයට සුදුසු තනි පදය තෝරා යටින් ඉරක් අඳින්න.


ගංගා, ඇළ, දොළ යනාදියේ ඇති වතුර

(1) කරදිය (2) මිරිදිය (3) වඩදිය

# 04. අන්තර් සම්බන්ධතා දැකීමේ හැකියාව

**කිසියම් තොරතුරක් හෝ තොරතුරු සමූහයක් යම් සමස්තයක් හෝ යම් වර්ගයක කොටසක් ලෙස හඳුනා ගැනීම.**


- මෙම රූපවලින් දක්වා ඇති සතුන් කාණ්ඩ දෙකකට වෙන් කළ හැකි ය.



(01) මෙම කාණ්ඩ නිවැරදිව දක්වා ඇති පිළිතුර තෝරන්න.

(1) AB සහ CD (2) AC සහ BD (3) AD සහ BC

(02) පහත රූපවලින් දැක්වෙන ද්‍රව්‍ය වෙන් කළ හැකි කාණ්ඩ ප්‍රමාණය නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරා එයට යටින් ඉරක් අඳින්න.



(1) 3 කි. (2) 2 කි. (3) 4 කි.

# 05. අර්ථකථන හැකියාව

කිසියම් සිද්ධියක්, වගුවක්, ප්‍රස්තාරයක්, අවස්ථාවක්, ක්‍රියාවක්, කතාවක් තේරුම්ගෙන එය තර්කානුකූලව පැහැදිලි කිරීම මෙමගින් බලාපොරොත්තු වේ.

(01) සෑමවිටම සත්‍යවන ප්‍රකාශය වන්නේ,

(1) ඉර බැස යන්නේ අහසේ බස්නාහිර පැත්තෙනි.

(2) ගෙඩි සෑදෙන්නේ ගස්වල ය.

(3) මාසයකට දින 30 කි.

(02) අසත්‍යවන ප්‍රකාශය වන්නේ,

(1) බවුසරය ඉන්ධන ගෙන යාමට ද යොදා ගනියි.

(2) පාද දහයක් ඇති ඉස්සා ජලයේ ජීවත් වෙයි.

(3) දැල් ගොතන මකුළුවාට පාද 06 කි.

# 06. පෙරකීමේ හැකියාව

**සපයා ඇති සංඛ්‍යා හෝ දත්ත යොදා ගනිමින් පෙරකීමේ හැකියාව (අනාගතයේ සිදුවිය හැකි) මෙමගින් අපේක්ෂා කෙරේ.**

(01) වාහන විකුණුම්හලක වර්ෂ 4 ක දී තිබුණු වාහන පහත වගුවේ දැක්වේ.

| වාහන වර්ගය | 2018 | 2019 | 2020 | 2021 | 2022 |
|---|---|---|---|---|---|
| කාර් | 110 | 210 | 310 | 410 | ............... |
| වෑන් | 30 | 35 | 40 | 45 | ............... |
| ලොරි | 06 | 08 | 10 | 12 | ............... |
| මෝ.බයිසිකල් | 75 | 100 | 125 | 150 | ............... |
| ජීප් | 30 | 25 | 20 | 15 | ............... |

i. 2022 වර්ෂයේ කාර් ගණන කීයක් විය හැකි ද? ----------------------------------------

ii. 2022 වර්ෂයේ වෑන් ගණන කීයක් විය හැකි ද? ----------------------------------------

iii. මෝටර් බයිසිකල් ගණන 2022 වර්ෂයේ කීයක් විය හැකි ද?

----------------------------------------

iv. ඉහත සටහන අනුව 2022 වර්ෂයේ ලොරි හා ජීප් රථ ගණනේ එකතුව කීයක් වේ ද?

----------------------------------------

## 07. තර්කන හැකියාව

**කිසියම් දත්ත සමූහයක් පදනම් කරගෙන නිගමනයකට එළඹීමයි.**

- මුලින් දී ඇති ප්‍රකාශයට අනුව දී ඇති ප්‍රකාශ අතරින් වඩාත් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(01) සමහර පිරිමි කලිසම් අඳිති. සමහර පිරිමි සරොම් අඳිති.

(1) පිරිමි අඳින්නේ කලිසම් පමණි.
(2) පිරිමි අඳින්නේ සරොම් පමණි.
(3) පිරිමි කලිසම් හා සරොම් ද අඳිති.

(02) අප පන්තියේ ඉගෙනුම ලබන නිමල් ඉතාමත් නරක ගති පැවතුම් ඇති ළමයෙකි. නිමල්ගේ පියා ද කවුරුත් අකමැති කරන පුද්ගලයෙකි.

(1) ආරේ ගුණ නෑරේ.
(2) කොහොඹ ගසට කරවිල වැල ගියා වගෙයි.
(3) උරුලෑවා ගිය පාර වගේ

# 08. පරිවර්තන හැකියාව

යම් චිත්‍රයක, කවියක, ප්‍රස්තාරයක, වචනයක හෝ වාක්‍යයක ඇති අදහස වෙනත් ආකාරයකට පෙරළීම මෙමගින් අපේක්ෂා කෙරේ.

- මුලින් දැක්වෙන වචනයට සමාන අර්ථය දෙන වචනය තෝරා යටින් ඉරක් අඳින්න.

(01) මව

(1) මව්බිම (2) මෑණියෝ (3) සිඳු

(02) ප්‍රකට

(1) ප්‍රසිද්ධ (2) පළමු (3) අප්‍රකට

- දී ඇති වචනයේ අදහස දැක්වෙන පිළිතුර තෝරා අංකය රවුම් කරන්න.

(03) ඇඹුල

(1) ගෙවිලිය කුඹුරට ගෙන යන ආම්පන්න.

(2) ගෙවිලිය කුඹුරට ගෙන යන ආහාර

(3) ගෙවිලිය කුඹුරට යන ආකාරය

දේපාර්තමේන්තුව

# 09. ගැටලු විසඳීමේ හැකියාව

★ **තමාගේ දැනුම, කුසලතාව හා අත්දැකීම් භාවිත කර අවස්ථාවට අනුව පිළිතුරු සෙවීම මෙමගින් අපේක්ෂා කෙරේ.**

(01) ඉන්ධන ලීටරයකින් 40km ක් ගමන් කළ හැකිය. යතුරු පැදියකින් 100 km ක දුරක් යෑමට අවශ්‍ය ඉන්ධන ප්‍රමාණය කොපමණ ද?

(1) 2 *l* (2) 2 *l* 500 m*l* (3) 1 *l* 500 m*l*

(02) මොනරා එක්වරක් නාද කරන විට ගිරවා හය වරක් ද, ගිරවා එක් වරක් නාද කරන විට මයිනා තුන්වරක් ද නාද කරයි නම් වැඩිම වාර ගණනක් නාද කරන්නේ,

(1) මයිනා (2) මොනවරා (3) ගිරවා

(03) පුටු පේළියක කුමාරි වාඩි වී සිටින්නේ මුල සිට බැලූ විට 18 වෙනියාට ය. අග සිට බැලූ විට 11 වෙනියාට ය. පුටු පේළියේ කී දෙනෙක් වාඩි වී සිටී ද?

(1) 28 (2) 26 (3) 27

# 10. සම්බන්ධතා දැකීම

යම් පුද්ගලයෙක්, ප්‍රකාශයක්, අවස්ථාවක්, ද්‍රව්‍යයක්, නමක්, රූපයක් හෝ සංඛ්‍යාවක් වැනි අවස්ථා අතර ඇති සමානත්වය / අසමානත්වය නිවැරදිව දක්මේ හැකියාව.

- හිස්තැනට ගැළපෙන වචනය තෝරන්න.

(01) ගුරුවරයාට පාසල මෙන් ගොවියාට


(1) කෙත (2) ළිඳ (3) උදැල්ල


(02) මාළුවාට වරල් මෙන් කුරුල්ලාට


(1) පියාපත් (2) පිහාටු (3) පෙඳය.

(04) වචන යුගලයට වඩාත් ම ගැළපෙන රූපය තෝරන්න.

උරග පාද ඇති


A 


B 


C 


(1) A (2) B (3) C

(05) එක් එක් රටාවේ ඊළඟට යෙදිය යුතු රූපය තෝරන්න.




(1) 


(2) 


(3) 

## 11. හේතුඵල හඳුනා ගැනීමේ හැකියාව

★ **යම් දෙයක් සිදුවීමට හේතුවක් බලපායි. යම් හේතුවකින් සිදුවන දෙය මගින් දැකිය හැක්කේ ප්‍රතිඵලයයි. හේතුව හා ප්‍රතිඵලය හඳුනා ගැනීම මෙයින් අපේක්ෂා කෙරේ.**

- පහත සඳහන් ඵලයන් සඳහා හේතු වශයෙන් දක්වා ඇති දේවලින් වඩාත් නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

(01) පැළෑටියක් දින කිහිපයක් පොල් කටුවකින් වසා තැබූ විට තණකොළ කහ පැහැයට හැරෙන්නේ,

(1) හිරු එළිය නොලැබූ නිසා ය.
(2) වාතය නොමැති නිසා ය.
(3) පොහොර නොමැති නිසා ය.

(02) දක්ෂ ළමයා ශිෂ්‍යත්ව විභාගයේ ඉහළ ලකුණු ලැබී ය. ඊට හේතුව වන්නේ,

(1) සාර්ථකව පිළිතුරු ලිවීම යි.
(2) හොඳින් පාඩම් කිරීමයි.
(3) දෙමාපියන් උදවු කළ නිසා ය.

(03) වලාකුළු පාවී යන්නේ,

(1) හිරු එළිය නිසා (2) සුළඟ නිසා (3) උෂ්ණත්වය නිසා

## 12. තොරතුරු සංවිධානය කිරීමේ හැකියාව

★ කිසියම් තොරතුරු සමූහයක් ක්‍රමානුකූලව ව්‍යුහයක් හෝ අර්ථවත් බවක්, ලැබෙන සේ සකස් කිරීම මින් පැහැදිලි කෙරේ.

- පහත දැක්වෙන සිදුවීම් අනුපිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.

(01)


(1)


(2)


(3)


(4)

(1) 1, 3, 4, 2 (2) 1, 3, 2, 4 (3) 1, 3, 2, 4

(02) 1.



2.



3.



4.





(1) 4, 3, 2, 1 (2) 1, 4, 3, 2 (3) 3, 4 2, 1


# 13. අවකාශමය සම්බන්ධතා දැකීමේ හැකියාව


★ සීමාසහිත ඉඩක් හෝ අවකාශයක් තුළ උපදෙස්වලට අනුව ද්‍රව්‍ය, රූප සංකේත හැසිරවීමේ හැකියාව හා කුසලතාව මෙමගින් ප්‍රගුණ වේ.


- මුලින් දී ඇති රූප ඊතලය ඇති දෙසට නවා අඳුරු කර ඇති කොටස කපා ඉවත් කර දිග හැරිය විට දැකිය හැකි ආකාරය තෝරන්න.




(1) 


(2) 

(3) 

(02) 

(1) 

(2) 

(3) 

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව ප්‍රාථමික අංශය

# 14. උපදෙස් පිළිපැදීමේ හැකියාව

(01) පහත කොටුව තුළ ඇති අකුරු හා සංඛ්‍යා කියවා පිළිතුරු තෝරන්න.

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 3 | 8 | A | 5 | C | 8 | S | 3 | 2 | 6 | K | 5 | T | 4 | 3 | Y |

i. මෙහි වැඩි වාර ගණනක් යෙදුණු සංඛ්‍යාව වන්නේ,

(1) 8 (2) 3 (3) 5

ii. මෙහි යෙදී ඇති ඉංග්‍රීසි අක්ෂර ගණන කීයද?

(1) 5 (2) 6 (3) 7

iii. එක ළඟ පිහිටි ඉලක්කම් දෙකක් එකතු කළ විට 8 සෑදේ. එම ඉලක්කම් 2 රවුම් කර පෙන්වන්න.

# අවධානයට

- 1-පත්‍රයෙන් ඉගෙනුම් හැකියා සහිත විභවතා මාන 14 ක් මැනීම හා ඒ සඳහා ප්‍රශ්න 40 ක් යොදා ඇත
- නමුත් දරුවන් මෙම 1-පත්‍රයට ලකුණු ලබා ගැනීමේ ප්‍රතිශතාත්මක අගය අඩු බවක් පෙන්නුම් කරයි
- 1-පත්‍රය ගුරුවරයාගේ ඉගෙනුම් ක්‍රියාවලිය මෙන්ම දරුවා ගේ සහජ හැකියා නිරූපනය කරන බැවින් එය ඉහළ ප්‍රතිශතයක් ගැනීම වැදගත්ය
- මෙසේ නොවීමට හේතුව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේදී සංකල්ප අවබෝධ කිරීමට යොදා ගන්නා ක්‍රමයේ දුර්වලතාවයයි
- මේ නිසා ගුරුවරයාගේ ක්‍රියාවලිය,භූමිකාව නිපුණතා පාදකව වෙනස්විය යුතුය

- ප්‍රශ්න පත්‍ර සකස් කිරීම අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා වලට
  අදාළවම සිදුවන බව NEREC අධ්‍යන වාර්තා පෙන්නුම් කරයි
- දක්ෂ සිසුන්ගෙන් අති දක්ෂ සිසුන් වෙන්කර ගැනීම සඳහා පළමු ප්‍රශ්න පත්‍රයේ දී
  ප්‍රශ්න කීපයක් පමණක් යොදා ගැනේ
- තක්සේරුකරණය මුල සිටම යොදාගත යුතු බවත් ඒ සඳහා
  ප්‍රතිපෝෂණ ද ක්‍රියාත්මක කළ යුතු බවත් වැදගත්ය
- ඉගෙනුම් ඵලයට ඒම සඳහා ප්‍රායෝගික ක්‍රියාකාරකම් මගින් ස්වයං අධ්‍යනයට යොමු කිරීම මගින් දරුවා  පංති කාමරයෙන් ඔබ්බට ගෙනයාම කළයුතුය
- විශේෂයෙන් ඉගෙනුම් ක්‍රියාකාරකම් කුඩා කොටස් වලට කඩාගෙන ක්‍රියාකාරකම් හඳුන්වාදීම, භාවිතය, ඇගයීම, ප්‍රතිපෝෂණය, ඉදිරි පොෂණය ලබාදීම කළ යුතුය
- දරුවාට නිපුණතා වලින් පිරි කුසලතා පූර්ණ මනෝමය අද්දැකීම් ලබාදෙන්න



# ස්තූතියි.



Jayasinghe (i.s.a),
D.E.O, Rideemaliydda,
Mahiyanganaya.
2023.05.21